# අභ්‍යවකාශ ගවේෂණයේ මංගල ජයග්‍රහණ

තුසිත මලලසේකර



සිය දැනුම දියුණු කරගැනීම සඳහා මෙන්ම තමන් තුළ පවත්නා කුතුහලය නිවා ගැනීම සඳහා මිනිසා අභ්‍යවකාශය ගවේෂණය කිරීමට යොමුවන්නට ඇත. මෙම අසීරු අභියෝගාත්මක ගමනේ එදා මෙදා ලද ජයග්‍රහණ කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

## පෘථිවිය සෞරග්‍රහ මණ්ඩලයට අයත් ග්‍රහයකු බව පළ කිරීම

1543 දී නිකොලොයි කොපර්නිකස් නම් පෝලන්ත ජාතික තාරකාවිද්‍යාඥයා විසින් පෘථිවියද, සූර්යයා වටා කක්ෂගතව පවතින ග්‍රහයකු බව පළ කළේය.

## ප්‍රථම දුරදක්නයෙන් ග්‍රහයන් නැරඹීම

1609 දී ඉතාලි ජාතික තාරකාවිද්‍යාඥ ගැලීලියෝ ගැලිලී තමන් නිපද වූ සරල දුරදක්නයක ආධාරයෙන් ග්‍රහයන් සහ උපග්‍රහයන් (චන්ද්‍රයන්) නිරීක්ෂණය කර කොපර්නිකස් මතය නිවැරදි බව තහවුරු කළේය.

## ප්‍රථම ද්‍රව - ඉන්ධන රොකටය

1926 දී ඇමෙරිකානු විද්‍යාඥ රොබට් ගොඩාර්ඩ් විසින් ලෝකයේ ප්‍රථම ද්‍රව - ඉන්ධන රොකටය ගුවන් ගත කරනු ලැබීය. තත්පර 2.5 ක කාලයක් තුළ මීටර් 12.5 ක් දුර ගමන් කිරීමට එය සමත්විය.

## සන්නිවේදන චන්ද්‍රිකා පිළිබඳ අදහස

1945 දී ආතර් සී ක්ලාර්ක් විසින් භූස්ථායි චන්ද්‍රිකා ආධාරයෙන් පණිවුඩ හුවමාරු කළ හැකි බවට අදහසක් ඉදිරිපත් කළේය.

## මිනිසා තැනූ ප්‍රථම කෘත්‍රිම චන්ද්‍රිකාව




1957 - අභ්‍යවකාශ ගත කළ ප්‍රථම කෘත්‍රිම චන්ද්‍රිකාව වන ස්පුට්නික් - 1 චන්ද්‍රිකාව පෘථිවි කක්ෂයේ මිනිත්තු 98ක කාලයක් ගත කිරීමට සමත් වීය. එය සෝවියට් දේශයේ තැනුවකි.

## අභ්‍යවකාශයට ගිය ප්‍රථම ජීවියා

1957 - අභ්‍යවකාශ ගත කළ සෝවියට් දේශයේ ස්පුට්නික් - 2 යානය තුළ බැඳ සිටි ලයිකා නම් බැල්ල අභ්‍යවකාශයට ගිය ප්‍රථම ජීවියා බවට පත්විය.



## සඳේ අඳුරු පැත්ත දැක්වූ යානය

1959 - ලූනා - 3 ලෙස හැඳින්වූ අභ්‍යවකාශ ගවේෂණ යානය ප්‍රථම වරට සඳේ අඳුරු පැත්තෙහි පින්තූර පොළොවට එවීමට සමත් විය.

### අභ්‍යවකාශයට ගිය ප්‍රථම මිනිසා

1961 - රුසියානු ජාතික යූරි ගගාරින් අභ්‍යවකාශයට ගිය ප්‍රථම මිනිසාය. 1961 අප්‍රේල් මස 12 වන දින වොස්ටොක් -1 යානයෙන් අභ්‍යවකාශයට ගිය ඔහු මිනිත්තු 108 කාලයක් පොළව වටා කක්ෂ ගතව සිටියේය. (මේ හේතුව නිසා සෑම වර්ෂයකම අප්‍රේල් 12 වන දිනය ලෝක අභ්‍යවකාශ දිනය ලෙස සැලකෙයි).

### ප්‍රථම චන්ද්‍රිකා රූපවාහිනී සංඥා එවීම

1962 - ටෙල්ස්ටාර් නම් චන්ද්‍රිකාව විසින් ප්‍රථම වරට රූපවාහිනී සංඥා සම්ප්‍රේෂණය කරනු ලැබීය.

### අභ්‍යවකාශයට ගිය ප්‍රථම කාන්තාව

1963 - රුසියානු ජාතික වැලන්ටිනා තෙරොස්කෝවා වොස්ටොක් 6 යානයේ අභ්‍යවකාශයට ගොස් පැය 70 යි මිනිත්තු 50ක කාලයක් අභ්‍යවකාශයේ ගත කරමින් 48 වාරයක් පොළොව වටා කක්ෂ ගතවිය.

### අභ්‍යවකාශයේ ප්‍රථම ඇවිදීම

1965 - ගමන් කරන අභ්‍යවකාශ යානයෙන් පිටතට පැමිණ අභ්‍යවකාශයෙහි ප්‍රථම ඇවිදීම සිදුකළේ ඇලෙක්සි ඒ. ලියනෝවා නම් රුසියානු අභ්‍යවකාශගාමියාය. එය සිදුවූවේ 1965 මාර්තු 18 වනදාය.

### සඳමතට පා තැබූ ප්‍රථම මිනිසා

1969 - සඳ මතට සිය පා තැබීමට අවස්ථාව ලද ප්‍රථම මිනිසා වන්නේ නීල් ආම්ස්ට්‍රෝන්ය. ඒ 1969 ජූලි 20 වනදාය. ඇපලෝ 11 යානය (මවුයානය) සැටරින් V රොකට්ටුව මගින් කෙනඩි අභ්‍යවකාශ මධ්‍යස්ථානයෙන් අභ්‍යවකාශයට ගෙන ගිය අතර චන්ද්‍ර කක්ෂයේදී මවු යානයෙන් වෙන්වූ ඊගල් යානයේ නීල් ආම්ස්ට්‍රෝන් සහ ඔහුගේ සගයා වූ එඩ්වින් ඕල්ඩ්‍රින් සඳ මතට ගෙන




ගියේය. මයිකල් කොලින්ස් මවුයානයේ සිටිමින් සිය සගයන්ගේ වික්‍රමය නැරඹීය.

### ප්‍රථම ඇමෙරිකානු අභ්‍යවකාශ මධ්‍යස්ථානය

1973 - මිනිසුන් සහිතව පර්යේෂණ කටයුතු සඳහා අභ්‍යවකාශයේ රැඳුණු ප්‍රථම ඇමෙරිකානු අභ්‍යවකාශ මධ්‍යස්ථානය ස්පේස් ලැබ්ය. පරීක්ෂණ



300කට වැඩි සංඛ්‍යාවක් අභ්‍යවකාශයේ සිදු කළ මෙම යානය 1979 දී පෘථිවි වායුගෝලයට ඇතුළුවී විනාශ වී ගියේය.

### සෞරග්‍රහ මණ්ඩලයේ තොරතුරු සොයායෑම

1977 දී අභ්‍යවකාශගත කළ වොයේජර් 1 හා 2 යානා අප සෞරග්‍රහ මණ්ඩලයේ ඈතට වන්නට පිහිටි බ්‍රහස්පති, සෙනසුරු හා යුරේනස් ඇතුළු ග්‍රහවස්තුවල තොරතුරු විමසමින් පොළවට වාර්තා කෙරෙති.

### අභ්‍යවකාශ බස්රිය ගමන් අරඹයි

1981 - අභ්‍යවකාශ ගවේෂණ චාරිකා ගණනාවකට චන්ද්‍රිකා හා වෙනත් පර්යේෂණ උපකරණ රැගෙන ගිය අභ්‍යවකාශ බස්රිය - ස්පේස් ෂටල් යානාව සිය මංගල ගමන 1981 අප්‍රේල් වලදී ඇරඹීය.

### රුසියානු මීර් අභ්‍යවකාශ මධ්‍යස්ථානය

1986 - "මීර්" ලෙස නම් කළ රුසියානු අභ්‍යවකාශ මධ්‍යස්ථාන මාලාවක පළමුවැන්න අභ්‍යවකාශයේ රැඳවීම සිදුවීම : අභ්‍යවකාශයේ රැඳවූ ප්‍රථම නිත්‍ය මිනිස් වාසස්ථානය ලෙස එය සැලකෙයි.

### ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය

1998 - රටවල් ගණනාවක් එකතුවීමෙන් ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයක් පිහිටුවීම. පෘථිවි තලයේ සිට කිලෝමීටර් 360ක් ඉහළ අභ්‍යවකාශයේ එය කක්ෂගතව පවතියි.

### සෙනසුරු තොරතුරු පෘථිවියට

2004 - කැසිනි නම් අභ්‍යවකාශ ගවේෂණ යානාව සෙනසුරු ග්‍රහයා පිළිබඳ තොරතුරු පෘථිවිය එවීය.

### අඟහරු තොරතුරු පෘථිවියට

2012 - අඟහරු ග්‍රහයාගේ තොරතුරු විමසන "කියුරියෝසිටි" අභ්‍යවකාශ යානය සිය සංචාරය ඇරඹීය.



**තුසිත මලලසේකර**
0718172766